

# මනුෂ්‍යයෙක් මාර්ගයක්

## විය හැක්කේ කෙසේද?

## මනුෂ්‍යයෙක් මාර්ගයක් විය හැක්කේ කෙසේද?

යේසුස්වහන්සේ ඔහුට මෙසේ කී සේක! "මාර්ගයද, සත්‍යයද, ජීවනයද, වන්නේ මමය. මා කරනකොටගෙන මිස, කිසිවෙකුට වෙන මාර්ගයකින් පියාණන්වහන්සේ වෙතට ඒමට නොහැක". (යොහන් 14:6) ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ එසේ කී සේක.

එහෙත් ඔබ කියන්නේ , "යම් තැනැත්තෙක් ස්වර්ගයට යන මාර්ගය විය හැක්කේ කෙසේද?" යන්නයි.

අපි මෙය සම්බන්ධව උපමාවක් දක්වමු. ඔබ නවාතැන් ගත් හෝටලයක් ගිනි ගත්තේය. ගින්දර නිසා, පස්වෙනි මහලේ තිබෙන,ඔබ සිටි කාමරයෙන් එළියට ඒමට ඔබට නොහැක. ඔබ භීතියෙන් තැති ගනියි. ඔබ මැරෙන්නට යන බව ඔබට පෙනේ. ඔබගේ පවුලේ අය ගැනත්, මිතුරන් සහ සදාකාලය ගැනත් ඔබ සිතයි. ඔබ උදව් ලබන පිණිස කෑගසන්නේය.

ඔබ දොර වසන්නේය. එහෙත්, සිදුරු තුලින් කාමරය ට දුම එන්නේය. මෙයින් ඔබට සිහි වන්නේ ගින්දර විසින් ක්‍රමයෙන් ගොඩනැගිල්ල විනාශ වන බවයි.

සයිරන් ශබ්ද නගයි. මිනිස්සු බියෙන් කෑ ගසති. ඔබත් බියසුළුවී, ඔබ බේරෙන්නට ඇති ඔබගේ බලාපොරොපොත්තුව ඔබට නැතිවෙන්නට ආසන්නයි. එහෙත් ක්‍ෂණිකයෙන්ම, ඔබගේ කාමරයට ඉනිමගකින් ආවාවූ ගිනි නිවන්නෙක් කාමරය තුලට හිස දමා, "මම ඔබව බේරා ගන්නට ආවෙමි" යි ඔබට ශබ්ද නගා කියන්නේය.



Sinhala-8

ඔබ පාර දෙසට එබී බලා, බියෙන් ඔබගේ හිස කාමරය තුලට ගනියි.

"ඔබ මට කියන්නේ ඔබ මාව ඒ ඉනිමග දිගේ පාරට ගෙන යන බවද?"

"ඔව්"

"වෙන මාර්ගයක් නැද්ද? පඩිපෙලින් නොහැකිද?"

"නොහැක"

"විදුලි සෝපානයෙන් යන්නට නොහැකිද?"

"නොහැක"

"ගින්නෙන් බේරෙන පිණිස යොද ඇති පඩි පෙලින් බසින්නට නොහැකිද?"

"දැන් මා කියන දෙය ඔබ අසන්න. අපට වාද කරන්නට කාලය නැත. වෙන මාර්ගයක් නැත. මාර්ගය මමයි. මාව විශ්වාස කරන්න. මා ස්වල්ප වේලාවකින් ඔබව මේ අනතුරින් සම්පූර්ණයෙන්ම බේරන්නම්".

ඔබට බේරෙන්නට හැක්කේ ගිනි නිවන්නා තුලින් පමණයි. ඔබගේ එකම බලාපොරොත්තුව වන්නේ ඔහු පමණයි. ඔබව බේරා ගැනීමට ඔබ ඔහුට ඉඩ දිය යුතුයි. නැතිනම් ඔබ ගින්නේ මැරෙයි. එනිසා ඔබ ඔහු කියන දෙය කිරීමට තීරණයක් ගනියි. ඔබ සම්පූර්ණයෙන් ඔහුගේ අතට බාර වන්නේය. ඔබ ඔහුව විශ්වාස කරන්නේය. ඔබ ඉනිමග දිගේ බසින්නේය. මේ රැකියාව කරන අන්දම ඔහු දන්නේය. ඔහු මෙය අති දක්‍ෂ ලෙස කරයි. ඔබ ස්වල්ප මොහොතකින් පදික වේදිකාව මත පා තබන්නේය. ඔබ ගැළවී ඇත. ඔබ ප්‍රීතියෙන් සහ සමාදනයෙන් උතුරන්නේය. ඔබගේ ගැළවීම, සමාදනය, ප්‍රීතිය සහ ඔබව මරණයෙන් ජීවිතයට ඇතුල්වන්නාවූ මාර්ගය වී ඇත්තේ ගිනි නිවන්නාය.



## මාර්ගය වන්නේ තැනැත්තෙකි.

ඔබ කියන්නේ, "මම නැතිවූනාවූ, වරදට පත් පව්කාරයෙකු වන බව මම දනිමි" කියාය. මක්නිසාද, "සියල්ලෝම පව්කොට දෙවියන් වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති" (රෝම 3:23) යි බයිබලය පවසයි. පැමිණෙන්නාවූ උදහසින් මා බේරී ස්වර්ගයේ වාසස්ථානයක් ලැබෙන්නට යන බව මා දැන ගන්නේ කෙසේද?

මගේ මිත්‍රය, ආගම හෝ සදාචාරය තුල ඔබට බලාපොරොත්තුවක් ඇතිවන්නට නොහැක. ගැළවීම තිබෙන්නේ දෙවියන්වහන්සේගේ දකුණතෙහි සිටින "මනුෂ්‍ය පුත්‍රයා ආවේ නැතිවූ දෙය සොයා ගළවන්නට" (ලූක් 19:10) යයි පැවසූ මනුෂ්‍යයා තුලිනි.

මෙය ගැන සිතන්න. "මෙය විශ්වාස වූ, සෑම දෙනාටම පිළිගැනීමට යෝග්‍ය වූ කියමනකි. කුමක්ද? යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මේ ලොවට පැමිණියේ පව්කාරයන් ගලවන්නටය". (1 තිමෝති 1:15)

දෙවියන්වහන්සේගේ පුත්‍රයා ඔබගේ පාපය උදුලන පිණිස තම ජීවිතය කල්වාරියේ පූජා කොට, ඔබගේ ස්වාමින්වහන්සේ සහ ගැලවුම්කරු වන පිණිස මළවුන්ගෙන් නැගිටි සේක. ගැලවීම තිබෙන්නේ උන් වහන්සේ තුලයි. පව් වලට සමාව, සමාදනය, ප්‍රීතිය, තෘප්තිය හමුවන්නේ උන්වහන්සේ තුලින් පමණයි."උන් වහන්සේ අපගේ සමාදනය වන සේක" (එපීස 2:14) "උන්වහන්සේ තුළ අපට උන්මහන්සේගේ ලේ තුලින් මිදීම, පව් කමාව ඇත. (එපීස1:7) පුත්‍රයා තිබෙන තැනැත්තාට ජීවනය තිබේ". (යොහන් 5:12)

හෝටලයේ ගින්නෙන් ඔබට බේරීමට නොහැකි වූ අන්දමට ඔබට සදකාල විනාශයෙන් මීදීමට නොහැක. මරණයෙන් බේරීමට තිබුනේ එකම මාර්ගයයි. එනම් තැනැත්තෙකි. ගිනිවිලෙන් බේරීමට තිබෙන්නේ එකම මාර්ගයයි. එනම් ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන තැනැත්තෙකි.

"එනිසා මනුෂ්‍යයන් සහ සහෝදරයෙනි, මේ දෙය දැනගන්වා. කුමක්ද? මේ මනුෂ්‍යයා තුලින් ඔබලාට පව් කමාව දේශනා කරනු ලැබේ . මෝසෙස්ගේ ව්‍යවස්ථාව තුලින් නිදහස් වීමට නොහැකි වුවත් උන් වහන්සේ තුලින් , අදහන සියල්ලන්ට නිදොස් වීමට හැක". (ක්‍රියා 13:38 - 39)

"උන් වහන්සේ ගැන සෑම අනාගත වක්තෘ කෙනෙක්ම සාක්ෂි දරන්නේ උන්වහන්සේ කෙරෙහි විශ්වාස තබන කවරෙකුට පව් සමාව ලැබෙන බවයි." (ක්‍රියා 10:43)

"සිටින්නේ එකම දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යයන් අතර සිටින්නේ එකම මැදහත් කාරයෙකි. මනුෂ්‍යයා වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේය" (1 තිමෝති 2:5)

ගිනි නිවන්නාට අසමර්ථ විය හැක. ඔහු මනුෂ්‍යයෙකු පමණි. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අසමර්ථ වෙන්නට නොහැක.මක්නිසාද, උන් වහන්සේ දෙවියන්වහන්සේ වන බැවිනි. ඔබ කල යුත්තේ උන්වහන්සේව ඇදහිල්ලෙන් පිළිගැනීමය. "යම් පමණ දෙනෙක් උන් වහන්සේ පිළිගත්තෝද, උන්වහන්සේ ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වීමට බලය දුන් සේක". (යොහන් 1:12)

ඔබ උන්වහන්සේව ලබාගත් බව නියතවම දැනගන්න. උන්වහන්සේ ගැන දැන ගැනීම පමණක් නොසෑහේ. ඔබ උන්වහන්සේ ගැන නියතවම තීරණයක් ගත යුතුයි.



උන්වහන්සේව දැන් ඔබ පිළිගත්තා බව එතුමාට කියන්න. ඔබ එසේ කල බව සතුටුවනු ඇත.

ඔබ අදම කරන්න. කල් දැමීම ආනතුරුදායකයි, ඔබ උන්වහන්සේට මෙසේ කථා කරන්න.

"මා ගැළවුම්කරුවෙකු අවශ්‍යවූ, නැතිවුන පව්කාරයෙකු බව මට අවබෝධ වී ඇත. මළවුන්ගෙන් නැගිට්ටා වූ, දෙවියන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන මනුෂ්‍යයා, මාගේ ස්වාමින්වහන්සේ සහ ගැළවුම්කාරයා ලෙස මා දැන් පිළිගෙන මාගේ පව්වලට සමාව දී ස්වර්ගයට යන්නාවූ මාර්ගය උන්වහන්සේ වන බව මම විශ්වාස කරමි. උන් වහන්සේගේ අනුග්‍රහය තුලින්, මා උන්වහන්සේ උදෙසා ජීවත් වෙන්නටත්, උන් වහන්සේ ගැන අන්‍යයන්ට සාක්ෂි දරන්ටත් මම අධිෂ්ඨාන කරන්නෙමි".

| |
|---|
| *මෙහි යොහන් 14:6 ආදි වශයෙන් සඳහන් වන්නේ ශු. බයිබලයෙන් උපුටාගත් කොටස් දැක්වීම සඳහාය.* |

වැඩි විස්තර දැන ගැනීම පිණිස පහත සඳහන් ලිපිනයට ලියන්න.